# කිරිඇල්ල නැදුන් රජමහ විහාරය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

**කුමාරි කේ.සී.ඩී.**[1]

රත්නපුර දිස්ත්‍රික්කයට අයත් කිරිඇල්ල නගරාසන්නයේ පිහිටා ඇති කිරිඇල්ල නැදුන් රජමහා විහාරය පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වශයෙන් ඉහළ වටිනාකමකින් යුත් ස්ථානයක් වේ. එම පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික පසුබිම අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ. ඒ උදෙසා ක්ෂේත්‍ර හා සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයන ක්‍රමවේද ලෙස යොදා ගැණුනි. මෙම විහාරයේ ඉතිහාසය සීතාවක යුගය දක්වා දිව යයි. එනම් සීතාවක රාජසිංහ රජු දවස කරඳූන දේවරක්ෂිත හිමියන් මෙම විහාරස්ථානය සමඟ සම්බන්ධතා පවත්වා ඇති අතර එම හිමියන් මෙම විහාරස්ථානය ඉදිකිරීම උදෙසා මුල් වී ඇත. කරඳන දේවරක්ෂිත හිමියන් විසින් මජ්ඣිම නිකාය අලංකාරවත් අත් අකුරින් පුස්කොළ පොතක ලියා උසස් බණ පොතක් සම්පාදනය කොට සීතාවක රාජසිංහ රජුට පිරිනමා ඇත. එයින් සතුටට පත් රජු රාජකරුණා සෙනවිරත්න වාසල අභයකෝන් මුදියන්සේගේ අත්සනින් යුතු ව අක්කර 8305ක භූමි ප්‍රමාණයක් අයත් වන පරිදි නින්දගමක් ප්‍රදානය කළ බව සඳහන් වේ. එහි දුම්බර නින්දගමකින් ලැබුණු නැදුන් ලී ගෙන්වා ගෙන එම කණු සිටවා ඒ මත නැදුන් ලීයෙන් ම තට්ටුව සාදවා ස්ථානයේ ටැම්පිට විහාරයක් ඉදිකර ඇති අතර පසුව මුල් කාලීනව කිරිඇල්ලේ පන්සල ලෙස හැඳින්වූ මෙම විහාරස්ථානය නැදුන් රජමහා විහාරය ලෙස හඳුන්වා තිබේ. මෙම ටැම්පිට විහාරය තුළින් මහනුවර යුගයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ හඳුනාගත හැකි වේ. වර්තමානයේ දී මෙම ටැම්පිට විහාරය මෙම ස්ථානයේ දැකගැනීමට නොලැබෙන නමුත් වර්තමාන බුද්ධ මන්දිරය එම ස්ථානයේ පිහිටා තිබේ. මෙහි බුද්ධ ප්‍රතිමාව සහ දේව ප්‍රතිමා පිහිටි කුටිය වටා පිටතින් බිත්තියක් බැඳ ඒ දෙපස ප්‍රදක්ෂිණා පථයක් නිර්මාණය කර එම බිත්තිවල වෙස්සන්තර, විදුර වැනි ජාතකකතා සිතුවම් කර තිබේ. මෙම පැරණි මන්දිරයට දකුණු පසින් ඇති විහාර මන්දිරය මෙයට වඩා විශාල මෙන් ම අලුතින් ඉදිකරන ලද්දක් වුවත් ආකෘතියෙන් පැරණි විහාරයේ ලක්ෂණවලට සමානකම් දක්වයි. මෙම පැරණි විහාරයෙහි බුදුපිළිම වහන්සේ දෙපස ඇති සැරියුත් මුගලන් ප්‍රතිමා වෙනුවට විෂ්ණු සහ සමන් දේව ප්‍රතිමා නිරූපණය කර තිබීම විශේෂ ලක්ෂණයක් වේ. එනම් විෂ්ණු දෙවියන් ශාසනාරක්ෂක දෙවියන් ලෙසත් සමන් දෙවියන් යනු සබරගමු ප්‍රදේශයට අවේනික වූ දේවියන් නිසාත් මෙසේ ඉදිකරන්නට ඇතැයි පිළිගනී. මෙහි මකර තොරණ ඉදිකර ඇත්තේ වෙනත් ස්ථානවල මෙන් බුදුගෙයට ඇතුළුවන දොරටුවට ඉහලින් නොවන අතර බුදුපිළිමයට ඉහලින් ඡත්‍රයක් ලෙසට දැක්වෙන ලෙස යි. පුරාවිද්‍යාත්මක කාලනිර්ණ අනුව මෙම පැරණි විහාර මන්දිරය වසර 168ක් පමණ පැරණි වන අතර ශ්‍රී ලංකාව තුළ ඇති විශාලතම ඇත් දළ යුගලය මෙම විහාරයේ තබා ඇත. මෙකී දත්ත අනුව නැදුන් රජමහා විහාරය සබරගමුව ප්‍රදේශයේ ඓතිහාසිකත්වය විදහාපාන පුරාවිද්‍යාත්මක ස්ථානයක් ලෙස නිගමනය කළ හැකි වේ.

**මුඛ්‍ය පද :** නැදුන් රජමහ විහාරය, කරඳන දේවරක්ෂිත හිමි, ටැම්පිට විහාරය

[1]පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
wickramasighedilrukshi@gmail.com